අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ

අංක 71 දරණ චක්‍රලේඛය

පිටපත්: සියලුම ප්‍රා.අ.අ. වරුන් හා ප්‍රධාන අධ්‍යාපන නි. වරුන්ට.

මගේ අංකය: මු.අ/2/20
1968. 2. මස 28 වැනි දින,
කොළඹ 2, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේදී ය.

සියළුම පිරිවෙන්හි කාර්‍යාධිකාරීන් හා
පරිවේනාධිපති හිමියන් වෙතයි.

පිරිවෙන් පරිපාලනය

පිරිවෙන් පරිපාලනය සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශයේ 1967 අංක 4 දරණ චක්‍රලේඛය පහත දැක්වෙන අයුරු සංශෝධනය කරනු ලැබේ.

(අත්සන)

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්

7 වැනි ඡේදයේ අගට පහත දැක්වෙන කොටස ඇතුළත් කළ යුතුය:-

" යෝග්‍ය ශිෂ්‍යයන් ගණයට ඇතුළත් නොවන ශිෂ්‍යයින් සඳහා, වෙනම නාම ලේඛණ තබා ගත යුතු ය. අධ්‍යාපන පනතේ 47 වැනි ඡේදය අනුව, කිසිම ශිෂ්‍ය යෙකුගෙන් ඇතුළත් කිරීමේ ගාස්තු හෝ ඉගැන්වීම සඳහා ගාස්තු අය කිරීමට ඉඩක් නැති බව මතක තබාගත යුතුය.

9 වැනි ඡේදයේ අවසානයට පහත දැක්වෙන වගන්තිය යොදන්න:-

" මෙම නියමය බල පැවැත්වෙන්නේ 1967.5.1 වැනි දිනට පසුව ලියාපදිංචි කරන ලද පිරිවෙන් වලට පමණි."

22 වැනි ඡේදය

මෙම ඡේදයේ "හිමියන් ගේ පත්වීම්" යන වචනවලින් පටන් ගන්නා ඉතිරි කොටස ඉවත්කර, ඒ වෙනුවට පහත සඳහන් වචන යොදන්න. " හිමියන්ට විරුද්ධව සුදුසු පරිදි විනයානුකූල ව ක්‍රියා කරනු ලැබේ."

29 වැනි ඡේදය

මෙම ඡේදයේ " යෝග්‍ය " යන වචනය ඉවත් කරන්න.

34 වැනි ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ඇතුළත් කරන්න:-

" රෙගුලාසි මාලාවේ 7 වැනි 9 වැනි සහ 10 වැනි ඡේද යටතේ අනුමත කළ ගුරුවරුන්ටත් 8 වැනි ඡේදය යටතේ පත්කර ඇති පරිවේනාධිපතින්ටත්, අනුමත කල නිවාඩු පිළිබඳ විස්තර ඇතුළත් කල මාසික ලේඛණ ඊළඟ මාසයේ 5 වැනිදාට පළමුයෙන් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි වෙත කාර්‍යාධිකාරි හිමි යැවිය යුතුය. යම්කිසි මාසයක කිසිම ගුරුවරයෙක් නිවාඩු ගෙන නැතත්, එසේ සඳහන් කරමින් වාර්තාව නියමිත දිනට කලින් ඉදිරිපත් කල යුතුය."

45 වැනි ඡේදය

මෙහි මුල් වාක්‍යයේ " පහත සඳහන්" යන වචන ඉවත් කොට, ඒ වෙනුවට "පිරිවෙන් රෙගුලාසි මාලාවේ 31 වැනි සහ 33 වැනි ඡේදවල සඳහන්" යන වචන ඇතුළත් කරන්න. එහි (1),(2), (3) යනුවෙන් හඳුන්වන උපඡේද ඉවත් කරන්න.

46 වැනි ඡේදය

එමහි දෙවැනි පේළිය මෙසේ සකස් කරන්න. "ගණන් ගනු නොලබන ශිෂ්‍යයින්ගේ නම් වෙනම නාම ලේඛනවල ඇතුළත් කළ යුතුය."